**විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල - 2016**

---------------------------------------------

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සහ 2015 අංක 1 දරන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නියමාවලියේ 24 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12(5) උප වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන
----------------

### 2.1 මතය
------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 ලැබිය යුතු ගිණුම්
----------------------

2016 දෙසැම්බර් 31 දිනට රු.44,126,524 ක් වූ අර්ථසාධක අරමුදලේ අක්‍රීය සාමාජික ශේෂය තුල, ගිවිසුම් කඩකරන ලද සාමාජිකයින්ගෙන් අය විය යුතු ශේෂයන් ද ඇතුළත් වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය
----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,792,683,501 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,544,644,089 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.248,039,412 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ආයෝජන ආදායම රු.174,309,903 කින් වැඩිවීම හා ආදායම් බදු වියදම රු.74,399,450 කින් අඩුවීම ඉහත අතිරික්තයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

පසුගිය වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල සැලකීමේදී එහි ක්‍රමික වර්ධනයක් නිරීක්ෂණය වූ අතර රජයට ගෙවන ලද ආදායම් බදු සඳහා ගැලපීම් කිරීමෙන් පසු සමාලෝචිත වර්ෂය අවසානයේ දායකත්වය රු.2,850,171,996 ක් විය. එය ඉකුත් වර්ෂයේ දායකත්වය සමඟ සැසඳීමේදී සියයට 6 ක වර්ධනයක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය
--------------------------

### 4.1 කාර්යසාධනය
---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1982 පෙබරවාරි 02 දිනැති අංක 155 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව උසස් අධ්‍යාපන ආයතන විසින් එහි සේවය කර, සේවය අවසන් කරන ලද සේවකයන්ගේ අර්ථසාධක අරමුදලේ ශේෂය නිදහස් කිරීමට අදාල විස්තර මාස 02 ක් ඇතුලත කොමිෂන් සභාවේ ලේකම් වෙත ලබා දිය යුතු අතර එම කටයුත්ත ආයතනයේ වරදක් හේතුවෙන් ප්‍රමාද වීම මත දායකයන්ට පොලී ගෙවීමට සිදු වුවහොත් එය අදාල වගකිව යුතු නිලධාරීන්ට අධිභාර කළ යුතු වේ. එසේ වුවද ප්‍රමාද කාලය මාස 04 සිට මාස 252 ක් දක්වා විහිදී තිබූ නමුත් එම ප්‍රමාද කාලය සඳහා ගෙවූ පොලිය රු.110,805 ක් වුවද චක්‍රලේඛ ප්‍රකාරව අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද , සේවය අවසන් කරන ලද සාමාජිකයින්ගේ අරමුදල් නිදහස් කිරීමේදී විශ්වවිද්‍යාල විසින් නියමිත කාලය තුළ ලිපිගොනු ඉදිරිපත් නොකිරීම මෙසේ ගෙවීම ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබූ අතර කොමිෂන් සභාව ප්‍රමාද වලක්වා ගැනීමට නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් ගෙවන ණය සම්බන්ධයෙන් 2007 අගෝස්තු 31 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 739 වන කමිටු රැස්වීමේදී ගත් තීරණයන් අනුව අරමුදලින් ණය ලබාදීම සඳහා ණය මුදල් ඉල්ලුම් කරන නිලධාරියාගේ ණය මුදල ඉල්ලුම් කරන මාසයට පෙර මාසයේ අර්ථසාධක දායක මුදල් හා පසුගිය මුළු ණය වාරික, ණය ඉල්ලුම් කරන මාසයේ 10 වන දිනට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මුදල් අංශයට ලැබිය යුතු වුවද ඒ අනුව ලැබී නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. එම ප්‍රමාදවීම් සම්බන්ධයෙන් සභාව විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ලේකම්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| අරමුදල් කළමනාකරණය | (i) සේවය අවසන් කරන ලද සාමාජිකයින්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම ප්‍රමාද වීම. |
| | (ii) මාසික ණය වාරික හා අර්ථසාධක අරමුදල් දායකයන් ප්‍රේෂණය කිරීම ප්‍රමාද වීම. |